නිපුණතාවය :- 03. ව්‍යාපාර සංවිධාන වර්ග සහ ඒවා පිළිබඳ මූලික තොරතුරු විමසමින් තමාට සුදුසු ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමට අවශ්‍ය පසුබිම සකසා ගනියි .

නිපුණතා මට්ටම :- 3.3. තනි පුද්ගල ව්‍යාපාරයක් ලියා පදිංචි කිරීමේ පියවර අනුගමනය කරයි .

(යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීම , ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියා පදිංචි කිරීමේ නෛතික ක්‍රියාපටිපාටිය සහ ලියා පදිංචි කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන) ඔබගේ පෙළ පොතේ පිටු අංක 40 සිට පිටු අංක 43 දක්වා හොඳින් කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න .

කෙටි සහ නිශ්චිත පිළිතුරු සපයන්න .

01. යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සැලකිල්ලට ගනු ලබන සාධක දෙකක් නම් කරන්න .

02. මහා පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදාල වන සාධක දෙකක් නම් කරන්න .

03. ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වන්නේ කුමන අවස්ථාවක දී ද ?

04. ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමට අදාල වන නීතිය නම් කරන්න .

05. ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමේ බලධරයා වන්නේ කවුරුන්ද ?

06. ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමට අදාල ඉල්ලුම් පත්‍රය ලබා ගත හැකි ස්ථානය නම් කරන්න .

07. ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීම සඳහා අදාල ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් තල යුත්තේ ව්‍යාපාරය ආරම්භ කර දින කීයක් ඇතුළත ද ?

08. ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියා පදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉල්ලුම් පත්‍ර දෙක නම් කරන්න .

09. ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියා පදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය පියවර වශයෙන් දක්වන්න .

10. ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීම තුළින් ව්‍යාපාරයට ලැබෙන ප්‍රයෝජන දෙකක් නම් කරන්න.

අභ්‍යාස

** ඔබගේ පෙළ පොතේ පිටු අංක 46 හි සඳහන් ක්‍රියාකාරකම 04 සඳහා පිළිතුරු සපයන්න .